# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

කොළඹ දී පමණක් පැවැත්වෙන මෙම අධිකාරයේ පහත සඳහන් පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීමට පහත සුදුසුකම් සපුරාලන මනා සෞඛ්‍ය තත්ත්වයකින් හා විශිෂ්ඨ චරිතයකින් යුතු ශ්‍රී ලාංකික අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

වයස - අවුරුදු 18 නොඅඩු සහ අවුරුදු 32ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරින්ට උපරිම වයස බල නොපානු ඇත. ඔවුන් සිය අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.)

තනතුරු : 1. ලිපිකරු සේවය - පුරප්පාඩු 02 යි.
2. පොත් බැඳුම්කරු - පුරප්පාඩු 01 යි.

1. ලිපිකරු සේවය අධ්‍යාපන සුදුසුකම් :

i. සිංහල/දෙමළ භාෂාව සහ ගණිතය ඇතුළු විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථයන් සහිතව එකවරක දී විෂයයන් හයකින් (06) ඉංග්‍රීසි භාෂාව ද ඇතුළුව අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා.පෙළ) සමත් වී තිබීම;
(සහතිකවල ඡායා පිටපත් ඇමිණිය යුතු ය.)

සහ

ii. අ.පො.ස. (උ.පෙළ) සියළුම විෂයයන්ගෙන් (පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර) එකවර සමත් ව තිබීම;
(සහතිකවල ඡායා පිටපත් ඇමිණිය යුතු ය.)

iii. පරිගණක දැනුම සහ ඉංග්‍රීසි භාෂාවෙන් රාජකාරි කිරීමේ හැකියාව විශේෂ සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

වැටුප් පරිමාණය - MN 2-06/2016

2. පොත් බැඳුම්කරු සේවය අධ්‍යාපන සුදුසුකම් :

අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී සිංහල/දෙමළ භාෂාව, ගණිතය ඇතුළුව විෂයයන් හයකින් (06) එක් වරදක දී සමත් ව ඉන් සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් තුනකට (03) සම්මාන සාමාර්ථ ලබා තිබීම;

සහ

ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ හෝ වෙනත් රජයේ ආයතනයකින් අවම වශයෙන් මාස 01ට නොඅඩු කාලයක් පොත් බැඳුම්කරණය පිළිබඳව පාඨමාලාවක් සාර්ථකව හදාරා අවසන් කර සහතිකය ලබා තිබීම.

වැටුප් පරිමාණය - PL 1-06/2016

තනතුරුවල ස්වභාවය - මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතුය. රාජ්‍ය සේවයට ප්‍රථමතාවට පත්වීම ලබන අයදුම්කරුවන් වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව ද දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර කරනු ලැබූ පුද්ගලයෙකු තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය වසරක වැඩ බැලීමේ කාලයකට යටත්ව පත් කරනු ඇත. පරිවාස කාලය හෝ වැඩ බැලීමේ කාලය අවසානයේ වෛද්‍ය පරීක්ෂණයෙන් සමත්වන්නේ නම් තනතුරේ ස්ථිර කිරීම සලකා බලනු ලැබේ.

ඔබගේ අයදුම්පත පහත දැක්වෙන ආදර්ශ ආකෘතිය ප්‍රකාරව පිළියෙල කර, අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් ද සමඟ **2025 අප්‍රේල් මස 21 දිනට** හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ලේකම්, පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය අංක 35, සිල්වා පටුමග, රාජගිරිය යන ලිපිනයට වෙත යොමු කළ යුතුය. අයදුම්පත හා ලේඛන එවනු ලබන ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ ඔබ ඉල්ලුම්කරන තනතුර සටහන් කළ යුතුය.

සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරා ගනු ලබන අතර, දැනට රාජ්‍ය සේවයේ නියුතු වුවන් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. නියමිත දින පසු වී ලැබෙන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

පී. වඩුගේ,
ලේකම්,
පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය.